

## සෙබලාගේ සොහොන

කඩපොල නුදුරු තැන පාලම ඉස්මත්තේ
පාරට ඉම්වෙලා ළඳු කැළයකි ඇත්තේ
එය පොදු සොහොන් පිටියකි පිටිසර පැත්තේ
එහිවූ බැඳපු සොහොනකි නෙත ඇදගත්තේ

දූවිලි මකුළුදැල් තිරයෙන් වසන ලද
එහි සිහිවටන පුවරුව දෙස බලන සඳ
රණ විරුවෙකුට උපහාරය පිදෙන ලෙද
කල සොහොනක්ය ඔහු මිහිදන් කරණ ලද

ගඳපානා ගසක සුදුමල් පොකුරු පිපී
මේ වීරයා වෙනුවෙන් කළ සොහොනක සිපී
නොදුටුව උදැල්ලක් පිහියක් අතක දැපී
රළු කටු පඳුරු වෙති සිටිනා පරිදි කිපී

රට දැය රකින්නට උතුරේ සටන් වැද
මිය ගිය උතුම් ජීවිතයක පවන් රොද
පාවී මැකී යනතුරුවත් ගුවන් මැද
මතකය රැදෙන්නේ මෙහෙමද දනන්හද

මුර වෙඩි බෑන්ඩ් වාදනයෙන් පෙරට ඇදී
ආචාරයෙන් මළගම දා පුදන ලදී
පසු පස ගමන් ගති මිනිසුන් සුසුම් දිදී
ඉන්පසු ටිකෙන් ටික යයි මතකයෙන් මිදී

මැරුනේ ඔබය දිණුවේ අප බව පෙන්නා
පැජරෝ ඉන්ට කූලර් මෙතනින් යන්නා
කාටත් මතක නැහැ ඔබ වැනි අය උන්නා
මේකද සදාචාරය රට පිළිගන්නා

අතු ඉති ඉවත්කොට කාගෙත් ඇස යන්න
පිසදා සිහිවටන ඵලකය පෑදෙන්න
තව මිනිසෙකුගෙ අවාධානය යොමුවෙන්න
සලසා මම ගියෙමි යලි ආපසු එන්න

**හල්දුම්මුල්ලේ ඒ. ඇම්. කුලසිංහ**
ක්ලේටන් දකුණ

## නිමිත්ත

වසරක් ගෙවී නව වසරක් ලබනා මොහොතේ
සව්දිය පුරා සැමරුවේ කිමද මිතුරේ
තව වසරකින් වියපත් වූ බවද
තව වසරකින් ආයුෂ කෙටි වූ වගද ?

සුභාෂිනී බුද්ධසිරි
බෙරික්

## දෝණිගෙ දෝණිට

හෙල රන් දෙරණ් වීර දේවි ඔබ විහාර මහ වේවා
විදු නැණ බලයෙන් ලෝකය ජයගත් මාරි කියුරි වේවා
ලෝ සත වෙනුවෙන් දිවියම කැප කල තෙරේසාව වේවා
පුංචි දුවේ ඔබ යහ ගුණයෙන් පිරි හෙල දුවකම වේවා

දියුණුවෙ රන්හිරු කිරණ පහස ලැබ ඔබේ ගමන් මග
එළිය වැටෙන්නයි
බොරු වලවල් නැති මල් මාවත් මැද ඔබේ දෙපා
ඉදිරියට තැබෙන්නයි
අපේ පැතුම මුළු දිවිය පුරාවට ඔබේ දෙතොල්
මැද සිනා රැඳෙන්නයි

මාලා කරුණාතිලක

## මණිකන්ඨ

ඉසුරු චාමර සෝමවීර



එළි කර අඳුරු අහුමුළු
එක තනි මොහොතකට
කෙටෙයි කෙටි විදුලි එළි

ඇදෙයි ඌ සෙමෙන් රහසින්
වෙලෙයි මා වටකර, තදින් සෙනෙහෙන්
බිකෙෂයි ඉරිතැලෙයි මා
නැගෙයි පෙන ගොබ අහස සිඹිමින්

කැතයි සෙවලයි කීවද
විසයි, ඌ රැදු සපෙක් වූව ද
වැසි දියෙහි තෙමෙමින්
විඳිමි ඒ රැදු පහස නිතියෙන්

රිදෙයි හී ගඩු නැගෙයි
ගැට දදා ප්‍රේමෙන් වෙලෙයි
කොතෙක් හරී හරී ඇසුවද
මහරු නා මිණ මට නොදෙයි
තනිව හිඳ සිටිමි වන රුක් මුල
දනිමි ඔබ නැවතත් නොඑන වග
නැතද ඒ මහරු නා මිණ
දකිමි පෙර නුදුටු මා හද මිණ



## දෝංකාරයක දෝංකාරය

එරබදු මලට අමතක වී හිනැහේ ද
කොවුලනි හඬන්නට ගී කඳ වෑහේ ද
අවුරුදු නැකත ගිනිලන සොහොනක සාද
කොවුළිඳු කොහිද අවුරුදු අමතක වී ද..

හදවත ගැහෙන උණුහුම කඳුළැලි වැස්සේ
නෙතදර පිපුණු කරඹ කැළෑ මල් අස්සේ
සුවඳැති කැකුලු පීදෙන්නට පැන් ඉස්සේ
ඇල්ලල මුල්ල අඳුරු ද දාවල තිස්සේ..

නො නැවත මියුරු හඬ සවනට ගලා එතී
නො සිතුව විලස නුඹ ඔය දුර ගියා මැකී
නො කියා කිසිත් මුව ඇඳි මඳහසක පෙතී
නො පියා දෑස නො සිටියෙ කිම කියන් සකී..

පපුතුර රැඳුණු සෙනෙහස අහසට උස ය
උස මිටි නො දැක බෙදුවේ සඳවත රැස ය
සුසුමින් පෙරී ආ මිනිසත්කම ගොස ය
සදලුතලා නොව පිල්කඩ දුන් තොස ය

පරයා ගියේ නැති මිතුරෙකි අනුන් නසා
නැඟුණා රැයෙක තරු පිරිවර ගුවන වසා
බිඳුණා නො වෙද සිහිනය නව ලොවක මුසා
සරනා කළල් දිය බොර කර නැති ද අසා

සගයෙක් නො වෙද අත අල්ලා ගෙන යන්ට
කවියෙක් නො වෙද සංතාපය අවුලන්ට
කොවුලෙක් නො වෙද නො ගැයූ ගීතය වෙන්ට
මිනිසෙක් කොහි ද නුඹ උන් තැන සම වෙන්ට!

තුෂාරි ප්‍රියංගිකා

# Simple Joys



Have you ever smelt the freshness of the morning breeze
Have you ever listened to the birds chirping
Have you ever seen butterflies flutter with colorful wings
These are simple joys in life

When a rainbow appears in the rainy sky
When a million stars decorate the night sky
When daffodils swing to the balmy breeze
These are the simple joys in life

When a mother holds her new born baby
Tenderly close to her heart
A world of kindness written on her face
These are the simple joys in life

Stop! and take a close look
These are the gifts money cannot buy
You do not need to be a millionaire
To enjoy simple pleasures in life

Suhashini Buddhasiri
Berwick

## ජීවිතය සැපවත්ව ගෙවී යන හැටි

කවුරු මොනවා කීවත් ජීවිතය ගැන
තම ජීවිතයෙ කළ දෑ පසු පසම එන
එය තේරුම් රැගෙන ජීවන රටා ගැන
විසඳා ගන්න ඔබ හට නැත අමුතු පැන

එක එක ජීවිතය සතුටේ වගකී ම
යුතුකම ඉටු කලොත් ලැබෙනවා සැනසී ම
වෙදකම, ගුරු කමින් මිනිසකු ගොඩ ලෑ ම
නොම ඉටු වුවොත් සිදුවෙයි දිවි පසු බෑ ම

මැති ඇමතිලා ලිපිකරු ගිහි පැවිදි ය න
සේවය කළ යුතුය මහජන කරුණු ගැ න
ගොවි වඩු කාර්මික සෙබලුන් වෙහෙස ව න
සැමහට ලැබෙයි තම කරුමෙහි පවද පි න

සිත තුළ ඇතත් පැසවා එන කුරුරු ක ම
පෙන්විය යුතු නොවේ සැම ඉදිරියේදී ම
අන් අය සමග සුහදව කටයුතු කෙරු ම
සැනසුම් දිවියෙ මග පාදයි හැමදා ම

පන්සල් පල්ලි කෝවිල් පිරි ජනතා ව
සුහදව සිතයි නම් හද බැති කිරියා ව
අවුලක් නොවේ දිවි ගමනට හැදියා ව
අවසන් හුස්ම යනතුරු ඇත සිරියා ව

**දයා අත්තනායක**
බටුවත්ත
ශ්‍රී ලංකාව

## සොබාදම් අම්මේ !

මහ පොලොව
දෙදරා
නගරයක්
සුනු විසුණු වී ගියසඳ
හදවත හඩා වැලපෙයි
නැසී ගිය අවිහිංසක
ජීවිත වෙනුවෙන්

ලක්ෂ්මී ගුණරත්න

## චූටි දෝණිට

පෙරුම් පුරා බලා සිටි
පැතුම් මල් පිපි
කිරි සිනා පෙරි පෙරි
සතුට යයි 'තිරි

කිරි සුවඳ ඉතිර වූ
පුංචි දූ සිංගිත්තී
වාසනා වේ ඔබට
මව් කිරුළු ගෙනෙන්නී

**ප්‍රසාදිනී වෙත්තසිංහ**
මිල්පාක්

# පහන් වැට

### භවයේ පැතුමක් ද?

සිහින විමානෙන් ඔබ හමු වේනම්
ලසෝ තැවුල් ගී පොතේ නොලියේ නම්
දුරු රට සිට අපසිත් එකට බැදේ නම්
මියෙන තුරා ඔබ දිදුලන තරුවක් වෙනම්

එනමග මල්අතුරන්නම් - ආදරේට මුවරද දෙන්නම්
සෙනෙහෙ පුදන්නම් - පුදසුනේ ඔබ රඳවන්නම්

ඉ . .. ති .. .. .න්

පවසන්න නොවලහා
මා දුවන්නේ මිරිඟු'වක් පසුපස දැයි කියා

ඔබ ආදරය හිස් කිරණක්ද
මහද නලවන සප්ත ස්වරයක්ද
දේදුනු පාටේ සංකලනයක්ද
ඔබ මට මයාවක්ද - පෙර භවයේ පැතුමක්ද?

කාන්ති වික්‍රමසූරිය